# මොණරාගල දිස්ත්‍රික්කයේ, කුරුල්ලන්ගල ප්‍රාථමික සිතුවම් වර්ගීකරණය

**ගම්පොළ විජය හිමි**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
gampolavijayathero@gmail.com

ප්‍රමුඛ පද : කුරුල්ලන්ගල, රක්ඛිත්තා කන්ද රජමහා විහාර, ප්‍රිමිටා

**හැඳින්වීම**

කුරුල්ලන්ගල, ප්‍රාථමික සිතුවම් සහිත අප්‍රකට පුරාවිද්‍යා ක්ෂේත්‍රයකි. ගමන් කිරීමේ පවතින දුෂ්කරතාව හේතුවෙන් එය නරඹන්නන්ගෙන් දුරස්ථ ව පවතීයි. පසුගිය දශකය තුළ පර්යේෂණ කණ්ඩායම් කිහිපයක් මෙම ස්ථානය නිරීක්ෂණය කරන ලද බව සඳහන් වේ. එම නිසා මෙම සිතුවම් පිළිබඳ විදිමත් වාර්තාකරණයක් සිදු කිරීම හා එහි සංදර්භමය වැදගත්කම අවධාරණය කරගැනීම කාලීන අවශ්‍යතාවක්ව පවතින අතර මෙම අධ්‍යයනයෙන් එකී කාර්ය අරමුණු කෙරේ.

මා ඇතුළු කණ්ඩායමක් විසින් 2014.07.25 වැනි දින සිතුවම් සහිත ස්ථානය මෙන්ම ආංශුක කලාපය ද නිරීක්ෂණය කරන ලදී. ඡායාරූප, පරිමාණගත දළ සටහන් හා අදාළ විස්තර ලේඛනගත කිරීම මඟින් වාර්තා කිරීම සිදු කෙරිණි. සිතුවම් පිළිබඳ දත්ත විශ්ලේෂණයේ දී වස්තුවිෂය, ස්ථානගතවීම හා නිරූපිත ස්වරූපය, ශෛලිය ලක්ෂණ හා භාවිත මාධ්‍ය වැනි සාධක සම්බන්ධයෙන් මූලික ව සලකා බැලිනි. ඒ අනුව යථෝක්ත සිතුවම්වල සමානත්වයන් මෙන්ම විවිධත්වයන් රැසක් පෙන්නුම් කෙරෙන අතර දනටත් මිහිපිට ජීවත්වන, ඇතම් විට ජීවත්ව වඳ වී ගිය කුරුළු විශේෂ හා තවත් සත්ව රූප කිහිපයක් සිතුවම් සඳහා වස්තුවිෂය වී ඇති ආකාරය දක්නට ලැබේ. යථෝක්ත සිතුවම් මෙරට සෙසු ස්ථානවලින් හඳුනාගෙන ඇති ප්‍රාථමික ගුහා සිතුවම් සමග සංසන්දනය කිරීමේ දී පෙනීයන කරුණ නම් වස්තු විෂය පමණක් නොව ශෛලීය වශයෙන් ද කැපීපෙනෙන විශේෂත්වයන් පවතින බවයි. මෙබඳු ප්‍රකාශන ගුණයෙන් හා තාක්ෂණයෙන් යුත් සිතුවම් වෙනත් ස්ථාන වලින් පෙන්නුම් නොකෙරෙන තරම්ය.

කුරුල්ලන්ගල සිතුවම්වලට සමාන වෙනත් සිතුවම් මෙරටින් හමු නොවූ පමණින් තත් සිතුවම් වලට හිමිවිය යුතු අවකාශ සංදර්භය ප්‍රතික්ෂේප කිරීම යෝග්‍යය නොවේ. මන්ද යත් මේ දක්වා නිසි අර්ථදක්වීමක් සිදුකළ නොහැකි පුරා සාධක, ව්‍යුහයන් සහ න-ස්පර්ශිත ක්‍රියාකාරකම් ලොව පුරා දක්නට ලැබෙන බැවිනි. කෙසේ නමුදු

මෙම සිතුවම්වලට කාලනිර්ණයක් ලබාදීම වඩාත් දුෂ්කර කාර්යයකි. මෙරට බොහෝමයක් ස්ථාන වලින් හමුවෙන සිතුවම් වලින් වැඩි ප්‍රමාණයක් වැද්දන් විසින් අඳින ලද සිතුවම් බව පර්යේෂකයන් කිහිප දෙනෙකුම සහේතුකව පෙන්වා දී තිබේ. මෙම සිතුවම්වල කර්තෘත්වය සම්බන්දයෙන් අපගේ මතය නම් මේවා පසු කාලීන ව නැතිනම් වැද්දන් විසින් අඳින ලද සිතුවම්වලට වඩා ප්‍රාග් ඓතිහාසික යුගයේ අඳිනලද සිතුවම් වීමේ වැඩි සම්භාවිතාවක් පවතින බවයි. තත් ආංශුක කලාපයෙන් මෙසොලිතික යුගයට අයත් පුරාවිද්‍යාත්මක සාධක ද හඳුනාගෙන ඇති අතර අප විසින් සිදුකළ ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී ද එබඳු නව ස්ථානයක් හඳුනාගත හැකි විණි. එ බැවින් සමස්තය සලකා බැලූ කළ මෙම සිතුවම් මධ්‍යශිලා යුගයට අයත්වීමේ ඉහළ ශක්‍යතාවක් පවතීයි.

**පිහිටීම**

කුරුල්ලන්ගල ලෙස හඳුන්වන සිතුවම් සහිත කුඩා පර්වත ශිඛරය ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රිකයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරඳගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටා තිබේ. එහි නිරපේක්ෂ පිහිටීම උතුරු අක්ෂාංශ $6^0$ 811' 877" ත් නැගෙනහිර දේශාංශ $81^0$064' 374" පෙන්වා දිය හැකි ය. ස්ථානය වෙත ගමන් කිරීම සඳහා ඇල්ල - වැල්ලවාය මාර්ගයේ ඇල්ල සිට කි.මී. 13ක් වැල්ලවාය දෙසට ගමන්කර හමුවන හන්දියෙන් දකුණු පසට හැරී කි.මී. 4 ගොස් රක්බිත්තා කන්ද රජ මහා විහාරයට පිවිසිය යුතු වේ. එහි සිට, අලිකොටේ ඔයට සම්බන්දවෙන සිඳී ගිය දිය කඳුර දිගේ කි.මී. 2.7ක් පමණ දුරක් ගොස් මීටර් 400ක් පමණ උසක් තරණය කිරීමෙන් සිතුවම් සහිත ස්ථානයට ලඟා විය හැකිය.

**වස්තුවිෂය**

සිතුවම් එකමත ඇඳීම නිසා සියලුම රූප පැහැදිලිව හඳුනාගැනීම අපහසු වන නමුත් අප අධ්‍යයනයේදී කුරුල්ලන් බවට නිසකයෙන් හඳුනාගත හැකි සිතුවම් 29ක් පමණ වාර්තා කිරීමට හැකිවිණි. කුරුල්ලන් පිළිබඳ අධ්‍යයනයන් වලදී බාහිර අංගලක්ෂණ අනුව සාමාන්‍යයෙන් ඔවුනොවුන් එකිනෙකාගෙන් වෙන් කර හඳුනාගැනීම සඳහා විශාලත්වය, හොටය, පාද, පෙඳය (වලිගය), පියාපත්, පියාඹන හැඩය, පැහැය, වෙසෙස් අඟපසඟ හා හැසිරීම් ආදිය මූලික වේ. මේවායින් ඇතැම් නිර්ණායක සිතුවම් වල ඇතුළත් කුරුලු ප්‍රභේද වර්ග කිරීමට මැනවින් භාවිත කළ හැකි වේ. ඇතිවන ගැටලුව නම් සිතුවම්කරණයේ දී කුරුල්ලන් විවිධ හා ඉතා සංකීර්ණ ඉරියව්වලින් නිරූපණය කර තිබීමයි. එමෙන් ම රේඛාකරණයේ දී හා වර්ණ පූර්ණයේ දී භාවිත ඇතැම් ප්‍රයෝග කුරුල්ලන්ගේ ශරීර අංග ඇතුළු විශේෂතා හුවා දැක්වීමට හෝ සිතුවම්වල අලංකරණය සඳහා භාවිත වුවේද යන්න හඳුනාගැනීම දුෂ්කර වේ. කුරුල්ලන්ගල පර්වත සිතුවම් අතර වෙනත් සත්වයන් නිරූපණය කෙරෙන රූප සටහන් දක්නට ලැබේ. එක් සිතුවමකින් යම් ප්‍රිමිටාවකු

*(Primate)* නිරූපනය වන බව හඳුනා ගැනීම හැකි වේ. ඌගේ දෙපා හා දිග වලිගය පැහැදිලි ව දක්නට ලැබෙන අතර ගමන් කරනා ඉරියව්ව එයින් නිරූපණය වේ. මෙහි දැක්වෙන සිතුවම් අතර ගෝනෙකු (*Rusa unicolor*) හෝ මුවෙකු (*Axis axis*) නිරූපණය වන බව නිසැකය. කිඹුලෙකු (*Crocodylus*) හෝ කබරගොයෙකු (*Iguana iguana*) වස්තු විෂය වන සිතුවමක් ද මෙහි අන්තර්ගතය. යටත් පිරිසෙන් මෙම සතුන් සියල්ලම පාහේ නූතනයේ මෙරට දක්නට ලැබෙන සත්ව විශේෂයන් වේ.වර්තමානයේ වර්ණ තවරා ශිලා පෘෂ්ඨය මත ස්පර්ශ කිරීමෙන් සළකුණු කරන ලද අත්ල රූප 12ක් පමණ හඳුනාගත හැකිය. යම් යම් ඇතැගිලි සළකුණු මැනවින් ස්පර්ශ නොවුණු අවස්ථාවන් ද අල්ල පමණක් සළකුණු වූ අවස්ථා ද දක්නට ලැබේ. ඇතැම් අත් රූපයන් වඩා දිගැටි බවක් ගන්නා අතර වර්ණයෙන් යුත් දැත් එක් ස්ථානයක තබා කෙටි දුරක් පසු පසට ඇදීමෙන් එකී හැඩය ලැබී ඇත. මූලික නිරීක්ෂණ අනුව යටත් පිරිසෙයින් පුද්ගලයන් දෙදෙනෙකුවත් අත් සළකුණු තබා ඇත. දකුණත හා වමත යන දෙඅත් රූ දක් නට ලැබුණද වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ වමත භාවිතයෙන් සෑදි අත් සළකුණු වීම විශේෂත්වක් ලෙස සැළකිමට හැකි ය. අත් සටහන්වල චතුරස්‍රකාර හැඩය අනුව ඒවා පුරුෂයන්ට අයත් බව උපකල්පනය කළ හැකි ය. මෙම සිතුවම් මතුපිට ජ්‍යාමිතික රේඛා මෙන්ම එබඳු රේඛා එක් කර අඳින ලද හඳුනාගත් ජ්‍යාමිතික හැඩතල දක්නට ලැබේ. එම රේඛා කුරුලු රූප හා වෙනත් රූප මත ව්‍යාප්තව තිබේ. එම රූප තිරස්, සිරස්, ඍජු, වක්‍ර රේඛා, තිත් සළකුණු, කඩ ඉරිවලින් සකස් වී ඇත. සිග් සැග් ක්‍රමයට අඳින ලද රේඛාවන්ද මෙහි දක්නට ලැබේ. යථෝක්ත සිතුවම් වපසරිය මත උක්ත සිතුවම් වර්ගීකරණය මැනවින් දැකීමට හැකිය.